# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
## உள்நாட்டு இறைவரித் திணைக்களம்
## DEPARTMENT OF INLAND REVENUE

ලේකම්අංශය
14වනමහල
දේශීයආදායම්ගොඩනැගිල්ල
ශ්‍රීමත්චිත්තම්පලම්ඒගාඩිනර්මාවත
තැ.පෙ. 515, කොළඹ2- ශ්‍රීලංකාව

செயலகம்
14 வதுமாடி
உள்நாட்டுஇறைவரிக்கட்டிடம்
சேர்சிற்றம்பலம்ஏகாடினர்மாவத்தை
த.பெ.இல. 515,கொழும்பு -2,இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 – 2338570/ 2338574/ 2338543/ 2338635/ 2338659

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 20135411 2135412 / 2135413

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


**චක්‍රලේඛ අංක: SEC/2020/03** **2020 මැයි** 19

බැංකු සහ මූල්‍ය ආයතන වෙත නිකුත් කෙරෙන චක්‍රලේඛය

**රඳවා ගැනීමේ බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම**

යම් තැන්පත් හිමියෙකු වෙත ගෙවිය යුතු පොලී, වට්ටම්, ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු වලින් ලැබෙන ආදායම මත **රඳවා ගැනීමේ බද්ද** හෝ **අත්තිකාරම් ආදායම් බද්ද** අඩු කිරීම සඳහා, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද උපදෙස් වලට සමගාමීව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2020.04.06 දින යොමු අංක PN/IT/2020 - 03 (Revised) යටතේ පළ කරන ලද ඔහුගේ නිවේදනය මඟින්, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට සිදු කරනු ලබන සංශෝධන සඳහා පාර්ලිමේන්තු අනුමැතියට යටත්ව, දැනටමත් දන්වා ඇති සංශෝධන අදාළ කර ගැනීමේදී පහසුකම් සැලසීම පිණිස සෑම බැංකුවකටම හෝ මූල්‍ය ආයතනයකටම අවශ්‍ය විස්තර සටහන් සහ උපදෙස් මෙම චක්‍රලේඛයෙහි දැක්වේ.

මෙම චක්‍රලේඛය 2020 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වේ.

**අ. පොලී මත රඳවා ගැනීමේ බද්ද**

රඳවා ගැනීමේ බද්ද අඩු කළ යුතු වන්නේ යම් නිර්වාසික තැනැත්තෙකු වෙත ගෙවනු ලබන යම් පොලී මුදලක් හෝ සමාන ගෙවීමක් මත පමණි.

**1. රඳවා ගැනීමේ බද්දට යටත් වන ගෙවීම් සහ බදු අනුප්‍රමාණ**

යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් යම් නිර්වාසික තැනැත්තෙකුට පොලී (නිදහස් පොලී හැර), වට්ටම් සහ ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු වලින් ලැබෙන ආදායම් (දේශීය ආදායම් පනතේ 32 වන වගන්තියේ දක්වා ඇති) ලෙස ගෙවනු ලබන, ශ්‍රී ලංකාවේ ප්‍රභවයක් සහිත ඕනෑම මුදල් ප්‍රමාණයක් 5% ක අනුප්‍රමාණයට රඳවා ගැනීමේ බද්ද අඩු කිරීමට යටත් වේ.

කෙසේ වෙතත්, නිර්වාසිකයෙකු වන එහෙත් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන පුද්ගලයෙකු සම්බන්ධයෙන් වන විට, රඳවා ගැනීමේ බද්ද අඩු කළ යුතු වන්නේ බැංකුව හෝ මූල්‍ය ආයතනයෙන් ලැබෙන ඔහුගේ එකතු කළ මුළු පොලී ආදායම යම් මාසයක් සඳහා රු. 250,000 ක් හෝ යම් තක්සේරු වර්ෂයක් සඳහා රු. 3,000,000 ක් ඉක්මවන්නේ නම් පමණි. මෙම කාර්ය සඳහා, රඳවා ගැනීමේ බද්ද

අඩු කිරීම වලක්වා ගැනීමට අදාළ පුද්ගලයාගෙන් හෝ ඔහුගේ නියමිත පරිදි බලය පැවරූ නියෝජිතයෙකු හෝ ඇටෝර්නිවරයෙකු වෙතින් තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයාගේ තක්සේරු වන ආදායම රු. 3,000,000 නොඉක්මවන බවට ප්‍රකාශයක් බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ලබා ගත යුතුය. (ප්‍රකාශයේ ආකෘතිය සඳහා කරුණාකර ඇමිණුම 1 බලන්න). **එවැනි ප්‍රකාශයක් නොලැබුණේ නම්, මුළු දළ පොලී ගෙවීම මත රඳවා ගැනීමේ බද්ද අඩු කළ යුතුය.** එවැනි ප්‍රකාශයක් ලැබුණේ නම්, එම ප්‍රකාශයේ සඳහන් කර ඇති පොලී ගෙවීම් ප්‍රමාණය මත රඳවා ගැනීමේ බද්ද අඩු කළ යුතුය.

## 2. ද්විත්ව බදු වැලැක්වීමේ ගිවිසුම්වල විධිවිධාන අදාළ කර ගැනීම

ශ්‍රී ලංකාව සහ නිර්වාසික තැනැත්තාගේ වාසික රට සමඟ පවතින ද්විත්ව බදු වැලැක්වීමේ ගිවිසුම්වල විධිවිධාන වලට යටත්ව, වඩා අඩු රඳවා ගැනීමේ බදු අනුප්‍රමාණය (ඉහත අයිතම 1 හි සඳහන් අනුප්‍රමාණයට සාපේක්ෂව) පොලී ගෙවීම මත අදාළ කර ගත යුතුය. නිර්වාසික තැනැත්තන්ට ගෙවීම් කිරීමේදී එම ගෙවීම සිදු කරන තැනැත්තා විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු නිශ්කාෂණ සහතිකයක් ලබා ගත යුතු අතර එම නිශ්කාෂණ සහතිකය නිකුත් කිරීමේදී වඩා අඩු අනුප්‍රමාණ (අදාළ වේ නම්) සලකා බලනු ලැබේ.

## 3. රඳවා ගැනීමේ බදු අඩු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

i. රඳවා ගැනීමේ බද්ද අඩු කළ යුතු පොලිය ලෙස දළ පොලිය (ණය වගකීමක් යටතේ නැවත ගෙවනු ලැබූ ප්‍රාග්ධන මුදල හැර) සලකනු ලැබේ. මුල් ගෙවීමට එරෙහි **"අතිරික්තයක්"** ලෙස සලකනු ලබන යම් ප්‍රමාණයක් (තැන්පතු සහතිකයක් සම්බන්ධයෙන් වන විට), වට්ටමක් හෝ ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් ලැබෙන ලාභයක් රඳවා ගැනීමේ බදු අඩු කිරීමට යටත් වන මුදල් ප්‍රමාණ ලෙස සැලකේ.

ii. නිර්වාසික තැනැත්තෙකුට ගෙවීමට නියමිත මුළු මුදල් ප්‍රමාණයම (රඳවා ගැනීමේ බදු අඩු කිරීමට පෙර) ප්‍රේෂණය කිරීම සඳහා යම් තැනැත්තෙකුට අවශ්‍ය වේ නම්, එම වටිනාකම ශුද්ධ වටිනාකම ලෙස සැලකිය යුතු අතර දළ වටිනාකම මත පදනම්ව රඳවා ගැනීමේ බද්ද ගණනය කළ යුතුය.

iii. විදේශ ව්‍යවහාර වටිනාකම, රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමේදී අදාළ තැනැත්තා විසින් ප්‍රේෂණය සිදුකරනු ලබන දිනයට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙහි පළ කර ඇති විනිමය අනුපාත (විකුණුම් අනුපාතය) යොදා ගත යුතුය.

iv. ආයෝජනය, ප්‍රකාශ කරනු ලබන තැනැත්තා සහ වෙනත් තැනැත්තෙකුට ඒකාබද්ධව අයත් වේ නම්, අදාළ ගෙවීම ඒකාබද්ධ අයිතිකරුවන් අතර ආයෝජනයට ඔවුන් ආයෝජනය සම්බන්ධයෙන් දරනු ලබන ස්වකීය සම්බන්ධතා වලට ක්‍රමානුකූලව බෙදිය යුතුය. ඒකාබද්ධ අයිතිකරුවන්ගේ කැමැත්ත නිශ්චය කළ නොහැකි නම් එය සමාන ලෙස සැලකිය යුතුය.

## 4. නිදහස් පොලිය

i. ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තෙකුට හෝ ශ්‍රී ලංකා රජයට ප්‍රදානය කර ඇති යම් ණය මුදලක් මත ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකු විසින් උපයන හෝ උපචිත වන පොලිය

ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව යම් තැනැත්තෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් වාණිජ බැංකුවක හෝ යම් විශේෂිත බැංකුවක විවෘත කරන ලද විදේශ ව්‍යවහාර ගිණුමක විදේශ ව්‍යවහාර මුදලින් ඔහුගේ බැරට ඇති මුදල් මත එම තැනැත්තාට උපචිත වන පොලිය

iii. ශ්‍රී ලංකා රජය විසින් හෝ රජය වෙනුවෙන් නිකුත් කළ,

අ) දේශීය ව්‍යවහාර හෝ විදේශීය ව්‍යවහාර මුදල් වලින් වටිනාකම නියම කර ඇති ස්වෛරී බැඳුම්කර මත නිර්වාසික තැනැත්තෙකුට (ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් නොවන) උපචිත වන පොලී, වට්ටම් හෝ උපලබ්ධි වීමෙන් ලැබෙන ඕනෑම ලැබීමක්

ආ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඇතුළු විදේශ ව්‍යවහාර මුදල්වලින් විටිනාකම නියම කර ඇති ඕනෑම ස්වෛරී බැඳුම්කරයක් මත අවස්ථාවෝචිත පරිදි ඕනෑම තැනැත්තෙකුට ගෙවන ලද හෝ ඉඩ දෙන ලද පොලි හෝ වට්ටම්,

iv. අ) තනාපති විනිර්මුක්ත නීතියක් හෝ සමාන නීතියක් හෝ යටතේ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රමාණයට විදේශීය රටක හෝ විදේශීය භූමි ප්‍රදේශයක රජය මඟින්;

ආ) ජාත්‍යන්තර සංවිධානයක් සහ ශ්‍රී ලංකා රජය අතර වූ ගිවිසුමක් යටතේ සලකන ලද නිදහස් කිරීම තානාපති විනිර්මුක්ති නීතියක් හෝ සමාන නීතියක් යටතේ සලකන ලද නිදහස් කිරීමට වඩා පුළුල් නම්, ඒ තානාපති විනිර්මුක්ති නීතිය හෝ සමාන නීතිය යටතේ හෝ, එම ජාත්‍යන්තර සංවිධානය සහ ශ්‍රී ලංකා රජය අතර වූ එම ජාත්‍යන්තර ගිවිසුම යටතේ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රමාණයට ජාත්‍යන්තර සංවිධානයක් මඟින්;

උපයන ලද මුදල් ප්‍රමාණ

v. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් 2008 ඔක්තෝබර් මස 21 වන දින හෝ එදිනට පසුව නිකුත් කරන ලද විදේශීය ව්‍යවහාර මුදල්වලින් වටිනාකම නියම කර ඇති ස්වෛරී බැඳුම්කර නිකුත් කරන්නෙකු විසින්, ශ්‍රී ලංකාවේ යම් නිර්වාසික තැනැත්තෙකුට හෝ යම් බලපත්‍ර ලාභී වාණිජ බැංකුවකට, අවස්ථාවෝචිතව පරිදි, ගෙවන ලද හෝ අවසර දී ඇති පොලියකට හෝ වට්ටම් මුදලකට සමාන මුදලක්

**ආ. අත්තිකාරම් ආදායම් බද්ද**

ඕනෑම වාසික තැනැත්තෙකුට ගෙවනු ලබන පොලී හෝ සමාන ගෙවීම් මත එම තැනැත්තාගේ එකඟතාවය ඇතිව අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ හැකිය. එකඟතාවය ලබා දී නොමැති නම්, එවැනි අවස්ථාවකදී අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ නොහැක.

**1. බැංකු හෝ මූල්‍ය ආයතනය වෙත කෙරෙන ප්‍රකාශය**

බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් ශ්‍රී ලංකාවේ ප්‍රභවය සහිත පොලියක් (නිදහස් පොලී හැර), වට්ටමක්, ඉස්ලාමීය මුදල් ගනුදෙනුවකින් ලබන ආදායමක් ලෙස (දේශීය ආදායම් පනතේ 32 වන වගන්තියේ දක්වා ඇති) ඕනෑම මුදල් ප්‍රමාණයක් ලබන හෝ උපයන වාසික තැනැත්තෙකුට, අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමට ඔහුගේ එකඟතාවය සඳහන් කර අමුණා ඇති ආකෘතිය [2 (අ) සහ 2(ආ) ඇමිණුම] අනුව ප්‍රකාශයක් බැංකුවට හෝ මූල්‍ය ආයතනයට ඉදිරිපත් කළ හැකිය.

**2. බදු අඩු කරන අනුප්‍රමාණ**

අදාළ තැනැත්තා විසින් ඔහුගේ ප්‍රකාශයෙහි දක්වා ඇති අදාළ මුදල් ප්‍රමාණ මත අදාළ ආදායම් බදු අනුප්‍රමාණ යොදා ගනිමින් අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතුය.

වාසික පුද්ගලයෙකු සම්බන්ධයෙන් වන විට, ගෙවීම් ප්‍රමාණය සහ බදු අනුප්‍රමාණ පහත දක්වා ඇත.

| **පොලී මුදල් ප්‍රමාණය (රු.)** | | **බදු අනුප්‍රමාණය** |
|---|---|---|
| **වාර්ෂික අඩු කිරීම් සඳහා (ත/ව)** | **මාසික අඩු කිරීම් සඳහා** | |
| රු. 3,000,000 ක උපරිමයක් දක්වා | රු. 250,000 ක උපරිමයක් දක්වා | 6% |
| ඊළඟ මුදල් ප්‍රමාණය, එහෙත් රු. 3,000,000 ක උපරිමයක් දක්වා | ඊළඟ මුදල් ප්‍රමාණය, එහෙත් රු. 250,000 ක උපරිමයක් දක්වා | 12% |
| ඉතිරිය | ඉතිරිය | 18% |

**වාසික පුද්ගලයෙකු හැර** ඕනෑම වාසික තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට**,** ගෙවීම් ප්‍රමාණය සහ බදු අනුප්‍රමාණ පහත දක්වා ඇත.

| **අස්ථිත්වය** | **බදු අනුප්‍රමාණය** | **මුදල් ප්‍රමාණය (රු.)*** |
|---|---|---|
| හවුල් ව්‍යාපාර | 6% | |
| පුන්‍යායතන | 14% | |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, අර්ථසාධක අරමුදල්, විශ්‍රාම වැටුප් අරමුදල් හෝ සමාපන අරමුදල් | 14% | |
| වාසික සමාගමක් ඇතුළුව අනෙකුත් වාසික අස්ථිත්ව | 24% | |

* (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතු මුදල් ප්‍රමාණය, ප්‍රකාශ කරන්නා විසින් අදාළ වන පරිදි සඳහන් කළ යුතුය. අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමේ කාර්ය සඳහා නිදහස් පොලී ඉවත් කිරීමට ප්‍රකාශ කරන්නාට හැකිය)

**ඇ. රඳවා ගැනීමේ බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද සඳහා පොදුවේ අදාළ වන උපදෙස්**

**1. බද්ද අඩු කළ යුතු වේලාව**

යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ගෙවීමක් කිරීමේදී අදාළ තැනැත්තාට එම මුදල අවස්ථාවෝචිත පරිදි, ගෙවන ලද, බැර කරන ලද, නැවත ආයෝජනය කරන ලද, සමුච්චිත කරන ලද, ප්‍රාග්ධනිත කරන ලද හෝ එම තැනැත්තාට ලබා ගත හැකි පරිදි තිබෙන අවස්ථාව බද්ද අඩු කළ යුතු වේලාව වේ.

**2. අඩු කරන ලද බද්ද ගෙවීම**

රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබූ බැංකු හෝ මූල්‍ය ආයතන විසින් අදාළ බද්ද සෑම ලිත් මාසයකම අවසානයට පසු දින පහළවක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතුය. ගෙවීම සඳහා අදාළ බදු වර්ග කේතය පහත පරිදි වේ.

- පොලිය මත රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්ද 43

**3. බදු අඩු කළ සහතිකය**

රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබූ සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින්ම අවස්ථාවෝචිත පරිදි, රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සම්බන්ධයෙන් සහතිකයක් දක්වා ඇති ආකෘතිය අනුව සෑම තැනැත්තෙකුටම නිකුත් කළ යුතුය. රඳවා ගැනීමේ බදු හෝ අත්තිකාරම් ආදායම් බදු සහතිකය ලිත් මාසයක් සඳහා විය යුතු අතර මාසය අවසාන වී දින 30 ක් ඇතුළත හෝ කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන පරිදි ලබා දිය යුතුය.

**4.** **අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ**

බැංකුව හෝ මූල්‍ය ආයතනය වෙත ඉදිරිපත් කරන ප්‍රකාශයක් හෝ සහතිකයක්, දේශීය ආදායම් පනතේ 181 වන වගන්තියේ කාර්ය සඳහා බදු නිලධාරියෙකු වෙත ලබා දුන් ප්‍රකාශයක් ලෙස සලකනු ලබන අතර අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ මත දණ්ඩන පනවනු ලැබේ.

**5.** **බැංකු හෝ මූල්‍ය ආයතන විසින් තබා ගත යුතු වාර්තා සහ ඔවුන්ගේ වගකීම්**

i. රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලබන බැංකු හෝ මූල්‍ය ආයතන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් යටතේ ලියාපදිංචි වූ රඳවා ගැනීමේ අනුයෝජිතයන් විය යුතුය. ඒ සඳහා ලියාපදිංචිය ලබා ගෙන නොමැති නම්, අදාළ තැනැත්තා රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම ආරම්භ කිරීමට දින 30 කට පෙර කොමසාරිස් ජනරාල් වෙතින් ලියාපදිංචි අංකයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

ii. අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමේ කාර්ය සඳහා, බැංකුව හෝ මූල්‍ය ආයතනයට වෙනම ලියාපදිංචි අංකයක් ලබා ගැනීම අවශ්‍ය නොවන අතර රඳවා ගැනීමේ අනුයෝජිතයෙකු ලෙස ලබා ගෙන ඇති ලියාපදිංචිය යටතේම එම අඩු කිරීම් සිදු කළ හැකිය.

iii. බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්දට යටත් වන සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම වාර්තා (ඔවුන්ට ලැබුණු ප්‍රකාශයන්ද ඇතුළත්ව) සපයා ඇති ආකෘතිය (කරුණාකර ඇමුණුම 4 බලන්න) අනුව තබා ගත යුතු අතර බදු නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවකදී භාර දිය යුතුය.

iv. රඳවා ගැනීමේ බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සම්බන්ධයෙන්, වාර්ෂික ප්‍රකාශයට අදාළ උපලේඛන භාර දිය යුතු අතර එම උපලේඛන ඉලෙක්ට්‍රොනික ආකෘතියක (Excel csv ආකෘතියක) භාර දිය යුතුය. කෙසේ වෙතත්, රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබූ තැනැත්තන් (බදු ගෙවන්නන්) සංඛ්‍යාව 20 ට වඩා අඩු වේ නම්, දෘඩ පිටපත් භාර දිය හැකිය.

**ඒ. නඳුන් ගුරුගේ**
**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

ඇමිණුම **1**

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

…………………………………………….. වෙත
……………...……………………………...
……………………………………………...
(බැංකුව හෝ මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය)

ගිණුම් අංක: …………………………………………….

තක්සේරු වර්ෂය: …………………………………

## නිර්වාසික, ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන පුද්ගලයන් විසින් බැංකු හෝ මූල්‍ය ආයතන වෙත කරනු ලබන ප්‍රකාශය

………………………………………………………………………………………………
…………………………………………………................... (ප්‍රකාශ කරන්නාගේ ලිපිනය) පදිංචි
…………………………………………………....................................................................
................................................................................................ (ප්‍රකාශ කරන්නාගේ සම්පූර්ණ නම) වන මම,

ශ්‍රී ලංකාවේ නිර්වාසික (2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන පරිදි) සහ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු (ශ්‍රී ලංකා පුරවැසි පනත අනුව) බව *

………………………………………………………………………………………………...........
......................................................................................................... (තැන්පතු හිමිකරුගේ ලිපිනය) හි පදිංචි ශ්‍රී ලංකාවේ නිර්වාසික (2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන පරිදි) සහ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු (ශ්‍රී ලංකා පුරවැසි පනත අනුව) වන .....................................................
.........................................................................................................................................
(තැන්පතු හිමිකරුගේ සම්පූර්ණ නම) මහතා/ මහත්මිය/ මෙනෙවිය ගේ නියමිත පරිදි බලය පැවරූ නියෝජිතයා/ ඇටෝර්නිවරයා බව *

ඉහත තක්සේරු වර්ෂය සඳහා මා/ ඔහු/ ඇය* විසින් මෙම පොලී ආදායමද ඇතුළත්ව උපයන ලද තක්සේරු කළ හැකි ආදායම (ශ්‍රී ලංකාව තුළදී උපයන ලද වෙනත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම්ද ඇතුළත්ව) රු. 3,0000,000 ඉක්මවිය හැකි බවත්**,**

මෙයින් ප්‍රකාශ කරමි.

එබැවින්, කරුණාකර මුළු පොලී ගෙවීම/ රු. ............................. ඉක්මවන මුදල් ප්‍රමාණය [= රු. 3,000,000 – මෙම පොලිය හැර ශ්‍රී ලංකාව තුළදී වෙනත් ප්‍රභවයන්ගෙන් උපයන ලද මුළු ආදායම (වෙනත් ප්‍රභවයන්ගෙන් උපයන ලද ආදායම රු. මිලියන 3 ට අඩු නම්)] * මත තක්සේරු වර්ෂය සඳහා රඳවා ගැනීමේ බද්ද අඩු කරන්න.

තැන්පතු හිමියාගේ

ගමන් බලපත්‍ර අංකය සහ නිකුත් කරන ලද රට ……………………………………………

ශ්‍රී ලංකාවේ ජාතික හැඳුනුම්පත් අංකය (ඇත්නම්) ...........................................................

ශ්‍රී ලංකාවේ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය (ඇත්නම්) ....................................................

වාසිකත්වය ඇති රට ……………………………………………

මා විසින් ඉහත කරන ලද ප්‍රකාශය සත්‍ය සහ නිවැරදි බව ප්‍රකාශ කරමි.

..................................... ......................................................

දිනය ප්‍රකාශ කරන්නාගේ අත්සන

(*අදාළ නොවන වචන කපා හරින්න)

**සටහන**

*බැංකුව හෝ මූල්‍ය ආයතනය වෙත ඉදිරිපත් කරන ප්‍රකාශයක් හෝ සහතිකයක්, දේශීය ආදායම් පනතේ 181 වන වගන්තියේ කාර්ය සඳහා බදු නිලධාරියෙකු වෙත ලබා දුන් ප්‍රකාශයක් ලෙස සලකනු ලබන අතර අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ මත දණ්ඩන පනවනු ලැබේ.*

ඇමිණුම **2** (අ)

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

…………………………….. වෙත
……………………………...
……………………………...
(බැංකුව හෝ මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය)

ගිණුම් අංක: ……………………………………

තක්සේරු වර්ෂය: ………………………………

## වාසික පුද්ගලයන් විසින් බැංකු හෝ මූල්‍ය ආයතන වෙත කරනු ලබන ප්‍රකාශය

……………………………………………………………………………………..
…………………………………………………………………...……... (ලිපිනය) හි
පදිංචි ..........................................................................................................................
……………………………………………………………... (සම්පූර්ණ නම) **වන මම,**

ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයෙකු (2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන පරිදි) වන බව සහ ඉහත තක්සේරු වර්ෂය සඳහා මා විසින් උපයන ලද තක්සේරු කළ හැකි ආදායම (වෙනත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම්ද ඇතුළත්ව) රු. 3,0000,000 ඉක්මවිය හැකි බවත් මෙයින් ප්‍රකාශ කරමි.

එබැවින්, තක්සේරු වර්ෂය සඳහා අදාළ පොලී ගෙවීම් වලින්, කරුණාකර පහත පරිදි අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරන්න.

| **තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත තක්සේරු කළ හැකි ආදායම (රු.)** | **අනුප්‍රමාණය** | **අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණය (රු.)** |
|---|---|---|
| 3,000,000 – 6,000,000 | 6% | * |
| 6,000,001 – 9,000,000 | 12% | * |
| 9,000,001 සහ ඊට වැඩි | 18% | |

***** උපරිම මුදල් ප්‍රමාණය රු. 3,000,000 විය යුතුය

ජාතික හැඳුනුම්පත් අංකය ............................................

බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය .........................................

මා විසින් ඉහත කරන ලද ප්‍රකාශය සත්‍ය සහ නිවැරදි බව ප්‍රකාශ කරමි.

මාගේ වාසිකත්වයෙහි සිදුවන යම් වෙනසක්, එම වෙනස සිදුවන අවස්ථාවේදී දැනුම් දෙමි.

................................... ...................................................

දිනය ප්‍රකාශ කරන්නාගේ අත්සන

ඇමිණුම **2(ආ)**

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

……………………………............. වෙත
……………………………..............
……………………………..............
**(**බැංකුව හෝ මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය**)**

ගිණුම් අංක: ……………………………………………

තක්සේරු වර්ෂය: ……………………………..….......

## වාසික අස්ථිත්ව විසින් බැංකු හෝ මූල්‍ය ආයතන වෙත කරනු ලබන ප්‍රකාශය

………………………………………………………………………………………………
.......................................................................................... (අස්ථිත්වයේ ලිපිනය) ලියාපදිංචි කාර්යාලය
පිහිටි .......................................................................................................................................
.............................................................................................................................. (අස්ථිත්වයේ නම)
...................................................................................................................................... (තනතුර) වන
.................................................................................................................................................
.................................................................................................................................................
(ප්‍රකාශ කරන්නාගේ සම්පූර්ණ නම**;** අස්ථිත්වයේ කළමනාකරු, අධ්‍යක්ෂ, ලේකම් හෝ බලය ලත් නිලධාරියා) වන මම, මෙම අස්ථිත්වය ශ්‍රී ලංකාවේ වාසික අස්ථිත්වයක් (2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන පරිදි) වන බව සහ ඉහත තක්සේරු වර්ෂය සඳහා මෙම අස්ථිත්වය සඳහා තක්සේරු කළ හැකි ආදායමක් තිබිය හැකි බව මෙයින් ප්‍රකාශ කරමි.

එබැවින්, තක්සේරු වර්ෂය සඳහා කරුණාකර පහත පරිදි අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරන්න.

| **අස්ථිත්වය** | **බදු අනුප්‍රමාණය** | **මුදල් ප්‍රමාණය (රු.)*** |
|---|---|---|
| හවුල් ව්‍යාපාර | 6% | |
| පුන්‍යායතන | 14% | |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, අර්ථසාධක අරමුදල්, විශ්‍රාම වැටුප් අරමුදල් හෝ සමාපන අරමුදල් | 14% | |
| වාසික සමාගමක් ඇතුළුව අනෙකුත් වාසික අස්ථිත්ව | 24% | |

* (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතු මුදල් ප්‍රමාණය ප්‍රකාශ කරන්නා විසින් අදාළ වන පරිදි සඳහන් කළ යුතුය.)

**අස්ථිත්වය:** හවුල් ව්‍යාපාර/ පුනාායතන/ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල/ සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල/ විශ්‍රාම වැටුප් අරමුදල/ සේවා නියුක්තයන්ගේ සමාපන අරමුදල්/ සමාගම/ සංස්ථාව/ වෙනත් අස්ථිත්ව ........................................................................ (කරුණාකර අස්ථිත්වය සඳහන් කිරීම හෝ අදාළ නොවන වචන කපා හරින්න)

බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය ............................................

මා විසින් ඉහත කරන ලද ප්‍රකාශය සත්‍ය සහ නිවැරදි බව ප්‍රකාශ කරමි.

.....................................                                    .......................................................

දිනය                                    ප්‍රකාශ කරන්නාගේ අත්සන

**ඇමිණුම 3(අ)**

සහතික අංකය:/ අනු අංකය: …………………………………………...

රඳවා ගැනීමේ අනුයෝජිතයාගේ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය: …………………………………….

## අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමේ සහතිකය

බැංකුවේ/ මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය:
………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………

ලබන්නාගේ නම සහ ලිපිනය:
……………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………

ප්‍රකාශයේ යොමු අංකය: ………………………………………………

ජාතික හැඳුනුම් පත් අංකය/ ගමන් බලපත්‍ර අංකය/ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය ……………………………

කාල සීමාව: සිට ……………………   දක්වා …………………………………

දළ ගෙවීම් ප්‍රමාණය (රු.) ……………………………………..

| තැනැත්තා | අදාළ වන අනුප්‍රමාණය | අත්තිකාරම් ආදායම් බද්දට යටත් වන මුදල් ප්‍රමාණය (රු.) | අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බද්ද (රු.) |
|---|---|---|---|
| වාසික පුද්ගලයන් | 6% | | |
| | 12% | | |
| | 18% | | |
| වාසික අස්ථිත්ව | 6% | | |
| | 14% | | |
| | 24% | | |
| වෙනත් | | | |
| එකතුව | | | |

බලය ලත් නිලධාරියාගේ නම සහ අත්සන ...................................................................................................

…………………......
දිනය

ඇමුණුම **3(ආ)**

සහතික අංකය/ අනු අංකය: …………………………………………...

රඳවා ගැනීමේ අනුයෝජිතයාගේ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය: …………………………………

**රඳවා ගැනීමේ බදු අඩු කිරීමේ සහතිකය**

බැංකුවේ/ මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය:

…………………………………………………………………………………………………

…………………………………………………………………………………………………

ලබන්නාගේ නම සහ ලිපිනය:

…………………………………………………………………………………………………

…………………………………………………………………………………………………

ජාතික හැඳුනුම් පත් අංකය/ ගමන් බලපත්‍ර අංකය/ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය (ශ්‍රී ලංකාව)

………………........................................................

කාල සීමාව: සිට ……………………  දක්වා …………………………………

දළ ගෙවීම් ප්‍රමාණය (රු.) ……………………………………..

| **තැනැත්තා** | **රඳවා ගැනීමේ බදු අනුප්‍රමාණය %** | **රඳවා ගැනීමේ බද්දට යටත් වන මුදල් ප්‍රමාණය (රු.)** | **අඩු කරන ලද රඳවා ගැනීමේ බදු ප්‍රමාණය (රු.)** |
|---|---|---|---|
| නිර්වාසික එහෙත් පුරවැසියන් වන පුද්ගලයන් | | | |
| නිර්වාසික පුරවැසියන් නොවන පුද්ගලයන් | | | |
| නිර්වාසික අස්ථිත්වය | | | |

බලය ලත් නිලධාරියාගේ නම සහ අත්සන ………………………………………………………………………

…………………......

දිනය

**ඇමුණුම 4**

රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම

නිර්වාසිකයන් වෙත කරන ලද පොලී ගෙවීම් සඳහා පහත උපලේඛනය සකස් කළ යුතුය.

| අනු අංකය | ලබන්නාගේ නම | ලබන්නාගේ ලිපිනය | වාසිකත්වය ඇති රට | ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුද නැත්ද යන වග | ප්‍රකාශයේ යොමුව (පුරවැසියන් සඳහා) | ගිණුම් අංක | ගෙවීම් කාල සීමාව | ගෙවූ දළ මුදල් ප්‍රමාණය | බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය/ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගමන් බලපත්‍ර අංකය ඇත්නම් | බදු නිශ්කාෂණ සහතිකයේ යොමු අංකය | බදු අඩු කිරීම සඳහා සලකනු ලැබූ මුදල් ප්‍රමාණය | බදු අනුප්‍රමාණය | අඩු කරන ලද බදු ප්‍රමාණය | ගෙවූ ශුද්ධ මුදල් ප්‍රමාණය | රඳවා ගැනීමේ බදු අඩු කිරීමේ සහතිකයේ යොමුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |

අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සම්බන්ධයෙන් පහත උපලේඛනය සකස් කළ යුතුය.

| අනු අංකය | නම | ලිපිනය | බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය/ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගමන් බලපත්‍ර අංකය | ගිණුම් අංක | ගෙවීම් කාල සීමාව | ගෙවූ දළ මුදල් ප්‍රමාණය | ප්‍රකාශයේ යොමුව | බදු අඩු කිරීම සඳහා සලකනු ලැබූ මුදල් ප්‍රමාණය | බදු අනුප්‍රමාණය | අඩු කරන ලද බදු ප්‍රමාණය | ගෙවූ ශුද්ධ මුදල් ප්‍රමාණය | බදු අඩු කිරීමේ සහතිකයේ යෙමුව (නිකුත් කර ඇත්නම්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |